# සිතක මහිම

යටි සිත හා උඩු සිත ලෙස සිත කොටස් දෙකකට බෙදනු ලබන්නේ මිනිසුන් විසින් ය. උඩු සිත සවිඥානික වන අතර යටි සිත අවිඥානික වෙයි. සිත එලෙස කොටස් දෙකකට බෙදීමේ පදනම අවිඥානික සිත් හා සවිඥානික සිත් ඇතිවීම ය. එහෙත් ප්‍රශ්නය වනුයේ අවිඥානික සිත් ඇති බව අප දන්නේ කෙසේ ද යන්න ය. අවිඥානික ව ඇතිවන සිතක් ගැන දැනගැනීම යනු සවිඥානික ව ඒ ගැන දැනගැනීම ය. අප සවිඥානික ව දන්නා එකම දෙය සවිඥානික සිත පමණ ය. මට සිතක් ඇතිවන බව මම දනිමි. අප දැනගන්නේ ද සිතෙන් බැවින් සිත ගැන දැනගැනීම යනු සිතීම ම වෙයි. එලෙස සිතිය හැක්කේ සවිඥානික සිත් පහළ වන අවස්ථාවල ය.

එහෙත් අවිඥානික සිත් පහළ වීම පිළිබඳ ව අපි නො දන්නෙමු. අපි අවිඥානික සිත් ඇති බව නොව මලක් හෝ ගසක් හෝ පැනක් හෝ ඇතැයි ගන්නේ කිනම් අවස්ථාවක දී ද? පැනක් ඇතැයි යනුවෙන් ගන්නේ, එනම් බාහිර ව ඇතැයි යනුවෙන් ගැනෙන්නේ, අපට ඇසට ස්පර්ශයට ආදී වශයෙන් පංචේන්ද්‍රියන්ට ගෝචර වන රූප කලාප පිළිබඳ ව මනස ආධාරයෙන් ද සැලකීමෙන් ය. මනස නොමැතිව අපට කිසිවක්, බාහිර රූප කලාපයක් හෝ අභ්‍යන්තර තත්ත්වයක් හෝ ග්‍රහණය කරගත නො හැකි ය. පැනක් දකින අපට පැනක් යන සිතක් පහළ වෙයි. එවිට අපි පැන ගැන සවිඥානික වන්නෙමු. එසේත් නැතහොත් පෙර දිනක අප විසින් දක්නා ලද පැනක් අපට සිහිකර ගත හැකි ය. පෙර දින දක්නා ලද පැන දැන් දැකගත නො හැකි ය. එහෙත් පෙර දින දකින ලද පැන ගැන මේ මොහොතේ අපට සවිඥානික විය හැකි ය. (පැනක් දකින්නේ යැයි කීව ද අප දකින පැනක් නැත. අප කරන්නේ ඇස ආධාරයෙන් රූප කලාපයක් නිර්මාණයකර ඒ රූප කලාපය පැන ලෙස ගැනීම ය. මින් මතුවට ද යමක් යනුවෙන් සඳහන්කර ඇති විට ඒ අපේ නිර්මාණයක් බව තේරුම්ගත යුතු ය.)

යමක් පිළිබඳ සවිඥානිකවීම සඳහා එය ඒ මොහොතේ පංචේන්ද්‍රියන්ට ගෝචර විය යුතු නො වෙයි. පංචේන්ද්‍රියන්ට ගෝචර වී හෝ නොවී හෝ යමක් පිළිබඳ සවිඥානික විය හැකි ය. සවිඥානික වීමේ දී ද අනෙක් තැනක දී මෙන් ම ප්‍රධාන වන්නේ සිතක් ඇතිවීම ය. අප සවිඥානික වන්නේ ය යන්නෙහි තේරුම අපේ සිත යමක් ගැන සවිඥානික වීම ය. එහෙත් යමක් ගැන සවිඥානිකවීම යනු ඒ පිළිබඳ සිත ගැන සවිඥානිකවීම ය. සිත ගැන සවිඥානික වන්නේ කුමකින් ද? පැහැදිළිව ම සිත ගැන සවිඥානික වන්නේ සිත ය. සිත ගැන වෙනත් ඉන්ද්‍රියකින් සවිඥානිකවිය නො හැකි ය. සිත ගැන සිතිය හැක්කේ සිතටම ය.

ඇතැම් සිතක් හා රූප කලාපයක් අපට සවිඥානික වෙයි. රූප කලාපයක් ඇතිව මෙන් ම නැතිව ද එවැනි සිත් පහළ වෙයි. එහෙත් අවිඥානික සිතක් ගැන අපට එසේ සවිඥානික විය හැකි ද? අවිඥානික සිත් ගැන සවිඥානික විය නොහැකි නම් අප අවිඥානික සිත් ගැන දන්නේ කෙසේ ද? ඒ අප පැනක් ගැන දැනගන්නා ආකාරයට ද? නැත්නම් ගුරුත්වාකර්ෂණය ගැන දැනගන්නා ආකාරයට ද? පැන හා ගුරුත්වාකර්ෂණය අතර ඇති වෙනස කුමක් ද? පැන හා ගුරුත්වාකර්ෂණය ගැන සිතන විට සිතේ වෙනසක් වන්නේ ද?

පැන අප හමුවේ තිබෙන පැනක් හෝ අප කලින් දැක ඇති පැනක් හෝ පැන යන වියුක්ත සංකල්පය හෝ විය හැකි ය. අප හමුවේ ඇති පැනක් නම් සිත ඒ ගැන දැනගන්නේ අනෙක් ඉන්ද්‍රියවල ද ආධාරයෙන් ය. අප ඉදිරියෙන් ඇති පැන අපට පෙනෙන අතර සිතෙහි ඒ පිළිබඳ ඇතිවන සිත ගැන සිත සවිඥානික වෙයි. අප හමුවෙහි නැති එහෙත් කලින් දැක ඇති හෝ ප්‍රයෝජනයට ගෙන ඇති හෝ පැනක් ගැන සිතට සිතීමටවන්නේ අනෙක් ඉන්ද්‍රියන්ගේ ආධාරයක් නොමැතිව ය. කලින් දැකීමේ දී හෝ ප්‍රයෝජනයට ගැනීමේ දී හෝ ඇස ස්පර්ශය වැනි ඉන්ද්‍රිය යොදාගෙන ඇති නමුත් දැන් පැන අප හමුවේ නොමැති බැවින් ඒ අනෙක් ඉන්ද්‍රිය මෙහි දී යොදා නො ගැනෙයි.

සිත කලින් දැක ඇති පැනක් ගැන සිතන විට ඒ පිළිබඳ රූපයක් සිතෙහි ඇතිවෙයි. පැන සිතෙහි මැවී පෙනෙයි. පෙනෙයි යන ක්‍රියා පදයෙන් විස්තර කෙරුණ ද එහි දී ඇස නම් ඉන්ද්‍රිය යොදා නො ගැනෙයි. අපට ඇස් වසා වුව ද

© Prof. Nalin De Silva

කලින් දැක ඇති පැනක් සිතෙන් සිතාගත හැකි ය. ඇතැම්විට අපි එසේ සිතීමට සිතින් මවාගන්නවා යැයි කියමු. මවාගත හැක්කේ සිතට ය. මවාගන්නේ භෞතික ව දැනට නොමැති වුවක් ය.

එහෙත් අපට මවාගත හැක්කේ දැනට නොමැති, එනම් මේ මොහොතේ අප ඉදිරියේ අනෙක් ඉන්ද්‍රියට ගෝචර වෙමින් නොපවතින, එහෙත් අතීතයේ යම්කිසි අවස්ථාවක දී (හෝ අවස්ථාවල) අනෙක් ඉන්ද්‍රියට ගෝචර වූ දේ පමණක් නො වෙයි. අප ඉදිරියේ ඇති පැන යන්න ද මනසෙහි නිර්මාණයක් වෙයි. අප ඒ නිර්මාණය දැනට පසෙකින් තැබුව ද වෙනත් නිර්මාණ ගැන කතාකළ හැකි ය. අපට දිව්‍ය ලෝකය හෝ අපාය හෝ සිතෙන් මවාගත හැකි ය. එසේත් නැත්නම් අප කිසිදිනෙක නොගිය ප්‍රදේශයක් පිළිබඳ ව අපට සිතෙන් මවාගත හැකි ය. අප එසේ කරන්නේ කෙසේ ද? කිසි දිනෙක මසැසින් නුදුටු දෙයක් මනසින් දකින්නේ කෙසේ ද?

එහි දී පැහැදිලි වන කරුණක් නම් අප දිව්‍ය ලෝකය හෝ අපාය හෝ මනසින් දකින්නේ අපට ඒ පිළිබඳ ව වෙනත් අය විසින් කරන ලද විස්තරවලට අනුව අපේ දත්දැකීම් මත පදනම් ව බව ය. දිව්‍ය ලෝකයෙන් චුතවීමට පෙර කිසි දිනෙක කිළුටු නොවන දිරා නොයන සළු පිළි පැළඳි දෙවියන් හා දිව්‍යාංගනාවන්  ගැන අප සිතන්නේ කෙසේ ද? අනෙක් අය කරන විස්තර අනුව වුව ද අප සිතින් මවාගන්නා දෙවියන් හා දිව්‍යාංගනාවන් මිනිස් ලොවේ පිරිමින් හා ගැහැණුන් මිස වෙනත් අය නො වේ. යම පල්ලන් වුව ද අපට මැවී පෙනේනේ අප දන්නා ගොරහැඩි රෞද්‍ර පිරිමි ආකාරයට ය. ඇතැම් විට එවැනි මිනිසුන්ට ඉදිරියට නෙරා ආ දළ දෙකක් ද සවිකර ඔවුන්ගේ රෞද්‍රභාවය වැඩිකර යම පල්ලන් බවට පත්කෙරෙයි.

මෙයින් අදහස් කෙරෙන්නේ අප සැම විටම අපේ දත්දැකීම් හා අනෙක් අයගේ විස්තර ඒ අත්දැකීම් හා ගලපාගෙන යම් යම් දැ සිතින් මවාගන්නවා යන්න නො වෙයි. අපට අවශ්‍ය නම් සිංහ හිසක් හා වඳුරු සිරුරක් සහිත සත්ත්වයකු මවාගත හැකි ය. ගණ දෙවියන් යනු මිනිස් කවන්ධයකට ඇත් හිසක් බද්ධකිරීමෙන් මවාගන්නා රූපයක්  ඇති දෙවියෙකි. එසේ සිතෙන් මවාගැනීමෙන් පසුව අවශ්‍ය පරිදි ගණ දෙවියන්ගේ පිළිම ද ඇඹිය හැකි ය. එහෙත් මෙහි දී වුව ද පෙනීයන කරුණ නම් එලෙස මවාගන්නා රූප ද අපේ වෙනත් අත්දැකීම් මත පදනම්වන බව ය.

ඉහත සඳහන් කරන ලද සියල්ල පිළිබඳ සිත් අනෙක් ඉන්ද්‍රිය සමග සෘජුව නොබැඳුන ද වක්‍රව හෝ බැඳෙයි. අප යමක් ඇසෙන් දකින ආකාරය ගැන ඇස නැතිව සිතෙන් මවාගනිමු. එසේත් නැත්නම් ඇසින් දුටු යම් යම් දේ එකතුකර ලොවෙහි කිසි තැනක ඇසට පෙනෙන්නට නැති රූපයක් සිතින් නිර්මාණයකරන්නෙමු. එහෙත් ඒ සැම විට ම අප සිතෙන් මවා ගන්නේ යම් වස්තුවකි, නැත්නම් පුද්ගලයකු හෝ සත්ත්වයකු ය.

ඇස නමැති ඉන්ද්‍රිය පමණක් නොව අනෙක් ඉන්ද්‍රිය හා සම්බන්ධ දේ ද අපට සිතින් මවාගත හැකි ය. අපට ඇතැම් විට ශබ්දයක් සිතෙන් මවාගත හැකි ය. එසේත් නැත්නම් සුවඳක් සිතින් ආඝ්‍රාණය කළ හැකි ය. මේ සියල්ලෙන් පැහැදිලිවන්නේ අනෙක් ඉන්ද්‍රිය ඇසුරෙන් සිත විසින් නිර්මාණය කෙරෙන දෑ පසුව ඒ ඉන්ද්‍රිය නැතිව ද සිතට මවාගතහැකි බව ය; එනම් නිර්මාණය කළ හැකි බව ය.

එහෙත් සිතට නිර්මාණය කළ හැක්කේ එසේ අනෙක් ඉන්ද්‍රිය ඇසුරෙන් ඒ අවස්ථාවේ දී ම හෝ පසුව ග්‍රහණය කරගන්නා දේ පමණක් නො වෙයි. යම් ද්‍රව්‍යයක හෝ පුද්ගලයකුගේ හෝ ගුණයක් පිළිබඳ ව අප දැනගන්නේ කෙසේ ද? අපි යමකු හොඳ පුද්ගලයකු යැයි කියමු. එසේත් නැත්නම් අසවල් ශිෂ්‍යයා කීකරු යැයි අපි කියමු. හොඳ, කීකරු ආදී ගුණ ගැන සිත දන්නා නමුත් ඒ ගුණ අනෙක් ඉන්ද්‍රියක් ඇසුරෙන් ගෝචර කරගන්නා ගුණයක් නො වෙයි. යමකුගේ හොඳකම ඇසට,කණට හෝ වෙනත් එවැනි ඉන්ද්‍රියක් ඇසුරෙන් ගෝචර කරගන්නක් නො වෙයි

එහි දී වුව ද අප සලකන්නේ යම් පුද්ගලයකුගේ නැත්නම් ශිෂ්‍යයකුගේ හොඳබව හෝ කීකරුබව ය. සිතට කළ හැක්කේ එසේ තනි තනි පුද්ගලයාගේ යම් ගුණයක් ගැන දැනගැනීම පමණක් නො වෙයි. අපට පුද්ගලයන්ගේ හෝ ද්‍රව්‍යවල හෝ පොදු ගුණයක් හෝ පොදු ගුණ ගැන කතාකළ හැකි ය. ඒ ගුණ ග්‍රහණය කරගත හැකි ය. ඝන ද්‍රව්‍යවල ඝනබව ගැන අපි සඳහන්කරමු. මේ ගුණය ස්පර්ශය පදනම් කරගනිමින් මිනිසුන් විසින් නිර්මාණය කෙරී තිබෙන්නක්

© Prof. Nalin De Silva

බව සැබෑ ය. එහෙත් අප කිසි දිනෙක දැක නොමැති වස්තුවක වුව ද ඝනබව ගැන අපට සිතාගත හැකි ය. මේ සංකල්ප වියුක්ත සංකල්ප වෙයි. සිතට වියුක්ත සංකල්ප ද සිතාගත හැකි ය.

ගණිතයෙහි ඇත්තේ වියුක්ත සංකල්ප ය. මේ පිළිබඳ අප කලින් ද සඳහන්කර ඇත. හතර යනු පොල් ගෙඩි හතරක් හෝ පුටු හතරක් හෝ නොව හතරේ ගොඩවල ඇති ගුණය ය. ඒ වියුක්ත ගුණයකි. සෑම දෙනා ම හතර ගැන ඒ අයුරින් සිතන්නේ යැයි මින් අදහස් නො වෙයි. එක් එක් අයගේ මනස්වලට කෙතරම් වියුක්ත ව සිතන්නට හැකි ද යන්න මත ඒ ඒ අය හතර නම් සංඛ්‍යාව ගැන සිතනු ඇත. මෙහි දී නැවත නැවතත් අවධාරණය කළ යුත්තේ මේ වියුක්ත ගුණ ද මනසෙහි නිර්මාණ බව ය.

මෙයින් පැහැදිලිවන කරුණක් නම් අප සිතන සෑම දෙයක් ම සිතෙහි නිර්මාණ බව ය. අප පුටුවක් දකින විට අප කරන්නේ අනෙක් ඉන්ද්‍රියවල, මේ අවස්ථාවේ දී ඇසෙහි, ආධාරයෙන් යම් සංකල්පයක් සිතෙන් නිර්මාණයකිරීම ය. සිත යනු නිර්මාණය කරන්නෙකි. අපේ සෑම සිතුවිල්ලක් ම නිර්මාණයකි. සිතෙහි කාර්යභාරය නිර්මාණයකිරීම යැයි කීම නිවැරදි යැයි මම සිතමි. ඒ මගේ සිතුවිල්ලක්, එබැවින් නිර්මාණයක් වෙයි.

මෙවැනි සංකල්පවලට අමතර ව කිසිවකු කිසි දා වෙනත් කිසිම ඉන්ද්‍රියක් ඇසරෙන් සිතෙන් නිර්මාණය කර නොමැති සංකල්ප ද අපට සිතෙන් නිර්මාණය කරගත හැකි ය. ඒ සඳහා හොඳම උදාහරණය ලෙස මා දකින්නේ ගුරුත්වාකර්ෂණය ය. නිව්ටන් පඬිවරයාට පෙර ලෝකයේ ගුරුත්වාකර්ෂණයක් නො තිබුණි. ගුරුත්වාකර්ෂණ සංකල්පය, එනම් ගුරුත්වය නිව්ටන් පඬිවරයාගේ නිර්මාණයක් විය. ඔහු එය නිර්මාණයකෙළේ ප්‍රශ්නයකට පිළිතුරක් ලෙස ය. ප්‍රශ්නය වූයේ පොල් ඇපල් ආදිය පොළොවට වැටෙන්නේ ඇයි ද යන්න ය. නිව්ටන් පඬිවරයා ඒ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ ඔහු විසින් නිර්මාණයකරන ලද ගුරුත්වාකර්ෂණය නම් සංකල්පය යොදා ගනිමින් ය. ඔහුට පෙර හෝ ඔහුට පසුව හෝ කිසිවකුවත් ඔහුවත් ගුරුත්වාකර්ෂණයක් දැක නැත. ස්පර්ශකර නැත. වෙනත් ඉන්ද්‍රියක් ඇසුරෙන් ග්‍රහණයකරගෙන නැත. එය හුදෙක් නිව්ටන් විද්වතාගේ මනසෙහි නිර්මාණය කෙරුණු සංකල්පයකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva